# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1996 අංක 11 දරන
# ජාතික ආරක්ෂක බද්ද
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1996 ජුනි මස 20 වන දින]

**(ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.)**

---

1996 ජූනි මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.**

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : ශත 45 යි.** **තැපැල් ගාස්තුව : රු. 2.00 යි**

# 1996 අංක 11 දරන ජාතික ආරක්ෂක බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1996 ජූනි මස 20 වන දින]

එල්. ඩී.—ඕ. 15/96

## 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1996 අංක 11 දරන ජාතික ආරක්ෂක බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනතේ 4 වන වගන්තියේ (ඊ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1991 අංක 52 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ ඡේදයේ (1) වන අනුඡේදයේ—

(අ) (අ) අයිතමයේ "යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සැදීමෙන් ලැබෙන පිරිවැටුම නොවන" යන වචන වෙනුවට "මේ අනුඡේදයේ (ආ) අයිතමයේ සඳහන් පිරිවැටුම නොවන" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) (ආ) අයිතමයේ "යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ" යන වචන වෙනුවට "(203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව, යම් මෝටර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන, යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ" යන වචන ආදේශ කිරීමෙන්.

(2) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයේ—

(අ) (අ) අයිතමයේ "යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සැදීමෙන් ලැබෙන පිරිවැටුම නොවන" යන වචන වෙනුවට "මේ අනුඡේදයේ (ආ) අයිතමයේ සඳහන් පිරිවැටුම නොවන" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) (ආ) අයිතමයේ "යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ" යන වචන වෙනුවට "(203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව, යම් මෝටර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන, යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ" යන වචන ආදේශ කිරීමෙන්.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ "පිරියත, යන්ත්‍ර හෝ උපකරණ" යන්නෙහි අර්ථකථනය ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම

2— ඩී039873— 6,130 (96/05)

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනයේ 6 වන අයිතමය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"6. 1996 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව එහෙත් 1997 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් කාර්තුවක් සඳහා—

(i) මේ අයිතමයේ (ii) වන ඡේදයෙහි සඳහන් පිරිවැටුම නොවන පිරිවැටුම මත සියයට 4.5

(ii) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව යම් මෝටර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සැදීමෙන් ලැබෙන පිරිවැටුම මත සියයට 2".

අතීතයට බලපෑම.

5. මේ පනතේ 2, 3 හා 4 වන වගන්තිවලින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන 1995 දෙසැම්බර් 29 වන දින ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

6. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල හා පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත [illegible] දෙසැම්බර් මස 15 වැනි දිනට දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය